# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. *පංතිය - 12
   *විෂය - ව්‍යාපාර සංඛ්‍යානය
   *අදාළ සතිය - මැයි 1

2. පාඩම හෝ ඒකකය - 5.ව්‍යාපාරික අවදානමට මුහුණදීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.
   5.8 - සම්භාවිතා ප්‍රවේශයක් ලෙස ප්‍රත්‍යක්ෂමය පිවිසුම භාවිත කරයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1. අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි පිළිබඳ මතකයට ගන්න.
   2.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   3.සම්භාවිතාව පිළිබඳ ඔබ දන්නා ප්‍රත්‍යක්ෂ ප්‍රකාශ පිළිබඳ සොයා ගන්න.
   4. සම්භාවිතාවෙහි ආකල නියමය පිළිබඳ ව පොතපතින් කරුණු රැස් කරගන්න.
   5. ප්‍රත්‍යක්ෂ යොදා ගනිමින් විවිධ සිද්ධිවල සම්භාවිතාව සඳහා ප්‍රකාශන ලබා ගන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view.php?id=21447

   2. ඊ නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=27651

   3. ගුරු ගෙදර - https://www.youtube.com/watch?v=WoB99dSdf3s&t=56s

   4. වෙනත් - යූ ටියුබ් - https://www.youtube.com/watch?v=oQ9DlA0AP6w

   https://www.youtube.com/watch?v=XYScldPSVTs

5. අතිරේක පොත්/සඟරා -

6.මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -

1. සම්භාවිතා පිළිබඳ ප්‍රත්‍යක්ෂ ප්‍රකාශ කරයි.
2. ප්‍රත්‍යක්ෂ යොදා ගනිමින් විවිධ සිද්ධිවල සම්භාවිතාව සඳහා ප්‍රකාශන ලියයි.
3. සම්භාවිතාවෙහි ආකල නියමය අර්ථ දක්වයි.
4. අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි අර්ථ දක්වයි.
5. අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධිවල මේලය සඳහා ආකල නියමය ප්‍රකාශ කරයි.

7.තක්සේරුව හා ඇගයීම-

කොන්ත්‍රාත්කරුවෙක් A හා B නම් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් සඳහා ටෙන්ඩර්පත් ඉදිරිපත් කර ඇත.ඔහුට A කොන්ත්‍රාත්තුව ලැබීම පිළිබඳ ව 80%ක විශ්වාසයක් ද B කොන්ත්‍රාත්තුව ලැබීම පිළිබඳ ව 60%ක විශ්වාසයක් ද පවතින අතර එම කොන්ත්‍රාත්තු දෙක ම ලැබීම පිළිබඳ 50% ක විශ්වාසයක් පවතී.

(අ) මෙම ප්‍රතිඵල වෙන් රූප සටහනක් ඇසුරෙන් ප්‍රකාශ කරන්න.

(ආ.) පහත සඳහන් එක් එක් සිද්ධියෙහි සම්භාවිතාව සොයන්න.

1.යටත් පිරිසෙයින් එක් කොන්ත්‍රාත්තුවක් ලැබීම.
2.ඔහුට මේ කොන්ත්‍රාත්තු දෙකෙන් එකක්වත් නොලැබීම.
3. ඔහුට මේ කොන්ත්‍රාත්තු දෙකම එකවර නොලැබීම.
4. A කොන්ත්‍රාත්තුව පමණක් ලැබීම.
5. B කොන්ත්‍රාත්තුව පමණක් ලැබීම.
6.මෙම කොන්ත්‍රාත්තු දෙකෙන් එකක් පමණක් ලැබීම.

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -